සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2018
இரண்டாம் தவணைப் பரீட்சை 2018
Second Term Test - 2018

07 ශ්‍රේණිය
07 தரம்
**Grade 07**

ගණිතය - I
கணிதம் - I
Mathematics - I

පැය දෙකයි
இரண்டுமணித்தியாலம்
**Two hours**

නම ........................................................................................................................................


* **සියළුම ප්‍රශ්නවලට පිළිතුර සපයන්න.**

**I කොටස**

01. සුළු කරන්න.

$10 + 2 \times 5$

02. දී ඇති රූපයේ පරිමිතිය සොයන්න.





Mathematics.lk

03. සුළු කරන්න.


| | kg | g |
|---|---|---|
| | 2 | 650 |
| + | 1 | 700 |
| | | |

04. පෙරේරා මහතා වැඩ නිම වී නිවසට පැමිණියේ ප.ව. 05.30 ට වේ. ඔහු නිවසට පැමිණි වේලාව සම්මත ආකාරයෙන් ලියන්න.

05. දී ඇති රූපයේ වර්ගඵලය සොයන්න.



06. රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.



07. පහත තොරතුරු අනුව 12 සහ 18 හි කු.පො.ගු. සොයන්න.

$12 = 2 \times 2 \times 3$


$18 = 2 \times 3 \times 3$

08. සුළු කරන්න.


$2.5 \times 10$

Mathematics.lk

09. රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ පරිමිතියට සමාන පරිමිතියක් ඇති සමචතුරස්‍රයක පාදයක දිග සොයන්න.




10. දී ඇති රූපයේ $\frac{3}{8}$ ක් අඳුරු කර දක්වන්න.




11. සුළු කරන්න.

$5\frac{2}{5} - 2\frac{1}{5}$


12. A = { 1 ත් - 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා } A කුලකයේ අවයව වෙන් රූප සටහනක දක්වන්න.

13. රූපයේ දැක්වෙන භාජනය සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය ජල ප්‍රමාණය නිමානය කර ලීටර වලින් දක්වන්න.




---

14. දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.




---

15. පොතක මිල රු. x හා පෑනක මිල රු.10 ක් වේ. පොත් 5 ක හා පෑන් 3 ක මිල සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න.

---

16. පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කර ලියන්න.

$\frac{3}{4}$ , 0.2 , $\frac{2}{5}$

Mathematics.lk

---

17. ඉඩමක් වටා එක් වටයක් කම්බි ගැසීම සඳහා 875 m ක් දිග කම්බියක් අවශ්‍යය. එවැනි කම්බි පටවල් 4 ක් ගැසීමට අවශ්‍ය කම්බිවල දිග km හා m වලින් දක්වන්න.

---

18.

$$\frac{3}{5} = \frac{\square}{100}$$

(i) සුදුසු අගය යොදා හිස්තැන සම්පූර්ණ කරන්න.

(ii) එය දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

---

19. A = { MAHATRAGAMA යන වචනයේ අකුරු } යන කුලකයේ අවයව සියල්ල සඟල වරහන් තුළ ලියා දක්වන්න.

---

20. සමන්ගේ වයස අවුරුදු x වේ. ඔහුගේ පියාගේ වයස ඔහුගේ වයස මෙන් හතර ගුණයට වඩා අවුරුදු 2 ක් වැඩි වේ. දෙදෙනාගේ වයස්වල එකතුව අවුරුදු 52 කි. ඉහත තොරතුරු ඇසුරින් සමීකරණයක් ගොඩ නගන්න.

## II කොටස

01. (a) (i) සුළු කරන්න.

$$\frac{2}{6} + \frac{3}{6}$$ (ල. 01)

(ii) සුළු කරන්න.

$$\frac{5}{8} - \frac{1}{4}$$ (ල. 02)

(iii) >, < හෝ = ලකුණු යොදා සම්බන්ධ කරන්න.

(a) $\frac{1}{2}$ ..................... $\frac{1}{3}$

(b) $\frac{3}{5}$ ..................... $\frac{4}{5}$

(c) $2\frac{1}{3}$ ..................... $2\frac{2}{6}$ (ල. 03)

(iv) නිමල් තම ඉඩමෙන් $\frac{3}{8}$ ක් සිය පුතාට ද $\frac{1}{4}$ ක් දියණියට ද බෙදා දුනි. පුතාට දියණියට වඩා වැඩිපුර ලැබුණු කොටස කොපමණ ද? (ල. 03)

(b) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සුළු කරන්න.

$(+2) + (-5)$ (ල.03)

Mathematics.lk

---

02. (a) සුළු කරන්න.

$2x + 3x$ (ල. 01)

(b) සෘජුකෝණාස්‍ර මල් පාත්තියක පළල මීටර් x වේ. එහි දිග පළල මෙන් දෙගුණයකි.

(i) එහි දිග x ඇසුරින් දක්වන්න.


(ii) x ඇසුරින් මල් පාත්තියේ පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගා ලැබෙන ප්‍රකාශය සුළු කරන්න. (ල. 03)

(iii) මල් පාත්තියේ පරිමිතිය 30m ක් නම් ඒ ඇසුරින් සමීකරණයක් ගොඩනගන්න (ල. 02)

(iv) සමීකරණය විසඳීමෙන් මල් පාත්තියේ දිග හා පලල සොයන්න. (ල. 04)

---


03. (a) (i) දී ඇති ඝනකාභයේ පරිමාව සොයන්න.




(ල. 03)

(ii) බීම 1 *l* 500 *ml* අඩංගු බෝතලයකින් 350 ml ක් ඉවත් කළ විට ඉතිරිවන බීම ප්‍රමාණය සොයන්න. (ල. 03)

(iii) දී ඇති විශාල ඝනකාභය තුළ කුඩා ඝනක කීයක් ඇසිරිය හැකි ද?




(ල. 03)

(b) ඇඹිලිපිටියෙන් පෙ.ව. 7.45 ට ගමන් ආරම්භ කළ බස් රථයක් ප.ව. 12.30 ට කොළඹට ළඟා විය. ගමන සඳහා ගතවූ කාලය සොයන්න. (ල. 03)


Mathematics.lk

04. (a) (i) දිග 3 cm ක් වූ රේඛා ඛණ්ඩයක් අඳින්න. එය AB ලෙස නම් කරන්න (ල. 03)

(ii) A ලක්ෂ්‍යය කේන්ද්‍රය කරගෙන AB අරය ලෙස ද ගෙන වෘත්තයක් නිර්මාණය කරන්න. එහි විෂ්කම්භයේ දිග ලියා දක්වන්න. (ල. 03)


(b) දී ඇති රූපයේ,


(i) බාහු හා කෝණය නම් කරන්න.




(ල. 03)

(ii) දී ඇති a හා b රූප හේතු දක්වමින් උත්තල හා අවතල බහු අස්‍ර ලෙස නම් කරන්න.


(a)


(b)

(ල. 03)

Mathematics.lk


05. (a) 48 යන සංඛ්‍යාව ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියා එය දර්ශක ආකාරයෙන් දක්වන්න. (ල. 03)

(b) (i) 0.125 භාගයක් ලෙස ලියා සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 02)

(ii) සුළු කරන්න.
$(2.12 \div 2) \times 1000$ (ල. 03)


(iii) $\frac{1}{2}$ , $\frac{3}{10}$ , 0.7, 0.07 ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න. (ල. 04)

06. (a) දී ඇති රේඛා අතරින් සමාන්තර රේඛා යුගල 02 ක් නම් කරන්න.





(ල. 02)

(b) දී ඇති රූපවල සමමිති අක්ෂ ගණන කීය ද?



(i)




(ii)

(ල. 02)

(c) (i) කෝණවල විශාලත්වය අනුව ABC කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද? (ල. 02)

(ii) එම ත්‍රිකෝණයේ මිනුම් වලට සමාන මිනුම් සහිත තවත් ත්‍රිකෝණයක් ගෙන ත්‍රිකෝණ දෙකෙහි දිගම පාද එකට එකතුවන සේ තැබීමෙන් සෑදෙන තල රූපය මිනුම් සහිතව ඇඳ එම තල රූපයේ වර්ගඵලය සොයන්න. (ල. 06)




Mathematics.lk

07. (a) (i) විජීය ක්‍රමයෙන් විසඳන්න.

$2x + 5 = 13$ (ල. 03)

(ii) $2\frac{1}{4}$ m ක් හා 10.5 ක් දිග ලණු කැබලි 2 ක මුළු දිග ගණනය කරන්න. (ල. 03)

(b) මිල දර්ශනය අනුව ,

**<u>මිල දර්ශනය</u>**

| | | |
|---|---|---|
| සහල් 1 kg | - | රු.70.00 |
| තේ කොළ 100g | - | රු.85.00 |
| සීනි 500g | - | රු.65.00 |
| පොල්ගෙඩි 01 | - | රු.45.00 |

(i) තේ කොළ 50g ක මිල සොයන්න. (ල. 01)

(ii) සහල් 2 kg ක් සීනි $1\frac{1}{2}$ kg ක් හා පොල්ගෙඩි 02 ක් මිලදී ගැනීමට අවශ්‍ය මුදල සොයන්න. (ල. 03)

(iii) ඉහත ද්‍රව්‍ය මිලදී ගැනීමට රු. 400 ක් ප්‍රමාණවත් බව නිමල් මහතා පවසයි. එම ප්‍රකාශය නිවැරදිදැ යි පහදන්න. (ල. 02)